**හානිපූරණය සඳහා වන කාර්යාලය - 2023**

-------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1. තත්ත්වාගණනය කළ මතය

හානිපූරණය සඳහා වන කාර්යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කාර්යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කාර්යාලය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කාර්යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

කාර්යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කාර්යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතු ය.

## 1.4. විගණන විෂයය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කාර්යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේ ද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදාගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු ය. කෙසේ වුව ද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන්වීමට හැකි ය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂයය පථය ද පුළුල්කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කාර්යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේ ද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කාර්යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කාර්යාලය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය**

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම්කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශවීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාලවකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

**1.5.2. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 70 ඡේදය ප්‍රකාරව ආයතනය විසින් ජංගම හා ජංගම නොවන වත්කම් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මුහුණතෙහි වෙනම වර්ගීකරණයක් ලෙස ඉදිරිපත් කළ යුතු ය. නමුත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ කෙටි කාලීන ආයෝජන රු.6,000,000 ක් දිගුකාලීන ආයෝජන තුළ පෙන්වීම නිසා ජංගම නොවන වත්කම්හි දිගුකාලීන ආයෝජනවල අගය එම ප්‍රමාණයෙන් වැඩියෙන් ද ජංගම වත්කමෙහි කෙටිකාලීන ආයෝජනවල වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද දක්වා තිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ අදාළ වර්ගීකරණ ඉදිරිපත් කර තිබුණ ද, එහි ඇතුළත් විය යුතු අගයයන් ගණනය කිරීමේදී සිදුව ඇති දෝෂයන් 2024 වර්ෂයේදී අදාළ වර්ගීකරණයන්හි නියමිත අගයයන් ඇතුළත් කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 70 ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

### 1.5.3. ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 ජනවාරි මස 12 වන දිනැති ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගය අනුව පාස්කු ප්‍රහාරය හේතුවෙන් මූලික අයිතිවාසිකම් කඩවූවන් සඳහා ඇති කළ වන්දි ගෙවීමේ අරමුදල සඳහා රාජ්‍ය දායකත්වය ලෙස ලැබුණු රුපියල් මිලියනයක මුදල මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය තුළ ආදායම් යටතේ පුනරාවර්ථන ප්‍රදාන ලෙස ද, එය වින්දිත අරමුදලට මාරු කිරීම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වියදම් ලෙස ද ගිණුම්ගත කිරීම හේතුවෙන් පිළිවෙලින් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය තුළ පුනරාවර්ථන ප්‍රදාන හා වියදම එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. තව ද එම රුපියල් මිලියනය සහ අධිකරණ නියෝගයට අනුව වගකිව යුතු පාර්ශවයන්ගෙන් ලද රු.35,825,588 ක මුදල් අරමුදලට බැරකර තිබුණු අතර, ඊට අදාළ සඳහා වෙනම ගිණුම් පොත්පත් පවත්වාගෙන ගිය ද, ඉදිරිපත්කර තිබූ මූල්‍ය ප්‍රකාශන තුළ එම ගනුදෙනු වාර්තාකර නොතිබුණි. ඊට අමතරව 2023 දෙසැම්බර් 31 දිනට අරමුදලේ ඉතිරි මුදල වන රු.2,894,838 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ වින්දිත අරමුදල් හා මුදල් ශේෂය තුළ වාර්තා නොකිරීම නිසා මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි හිමිකම් හා මුදල් ශේෂය එම වටිනාකමෙන් අඩුවෙන් වාර්තාකර තිබුණි. | ශ්‍රේෂ්ඨාධිකරණ නියෝග අනුව වින්දිත අරමුදල වෙනුවෙන් රුපියල් මිලියනයක් රාජ්‍ය දායකත්වය වෙනුවෙන් අතිරේක ප්‍රතිපාදනයක් ලෙස අධ්‍යක්ෂ ජනරාල් ජාතික අයවැය දෙපාර්තමේන්තුව මගින් හානිපූරණය සඳහා වන කාර්යාලය වෙත ලබාදුන් අතර, එකී ප්‍රතිපාදනය නිසි පරිදි හානිපූරණය සඳහා වන කාර්යාලයේ වාර්ෂික අයවැය ඇස්තමේන්තුවට ඇතුළත් කර මාසිකව අක්මුදල් ඉල්ලුම් කිරීමේදී එකී රුපියල් මිලියනයක මුදල ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ නිර්දේශය මත භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව මගින් හානිපූරණය සඳහා වන කාර්යාලය වෙත ලබාදී ඇත. අමතර ප්‍රතිපාදනයක් ලැබීම හා එකී මුදල රාජ්‍ය වියදම් ලෙස දරා ඇති බවට නිසි පරිදි ගිණුම් මගින් ගනුදෙනු සටහන්කර ඇත. 2023 වර්ෂයේදී අවසන් ගිණුම් මඟින් අදාළ හෙළිදරව් කිරීම් සිදුකර ඇති අතර, 2024 වර්ෂයේ සිට මෙකී අරමුදල අවසාන ගිණුමට ගැළපීමට ද කටයුතු කරමි. | සමාලෝචිත වර්ෂයට අදාළ ආදායම් හා වියදම් පමණක් නිවැරදිව ගිණුම්ගත කිරීමට පියවරගත යුතු අතර, වර්ෂයට අදාළ ආයතනයේ හිමිකම හා මුදල් ශේෂය මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ නිවැරදිව දැක්වීමට පියවර ගත යුතු ය. |
| (ආ) | 2019 වර්ෂයේදී පාස්කු ප්‍රහාරය සඳහා වන්දි ප්‍රදානය කිරීමේදී වන්දිලාභියෙකුට වැඩිපුර ගෙවන ලද රු.300,000 ක් හා රු.112,900 ක් වටිනා ලිපිද්‍රව්‍ය තොගයක් අස්ථානගත වීමේ සම්පූර්ණ අලාභය පොත්වලින් කපා හැරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණු අතර, මෙම කපා හැරීම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව වර්ෂයට අදාළ වියදම් එකී වර්ෂය තුළම ප්‍රවර්තන වර්ෂයේ වියදම් ලෙස අවසාන ගිණුම මගින් ගැළපුම් කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | වර්ෂයට අදාළ වියදම නිවැරදිව ගිණුම්ගත කර මූල්‍ය ප්‍රකාශන තුළ පෙන්නුම් කළ යුතු ය. |

තුළ වියදමක් වශයෙන් වාර්තා නොකර සමුච්චිත අරමුදලෙන් අඩුකර තිබීම නිසා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය තුළ වර්ෂයේ වියදම රු.412,900 ක් අඩුවෙන් සටහන්කර තිබුණි.

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | | |
| | (i.) | 264 ඡේදය | සමාලෝචිත වර්ෂයේදී වින්දිතයන් 362 දෙනෙකුට චෙක්පත් මගින් රු.547,526,491 ක මුදලක් හා සෘජු ප්‍රේෂණ මගින් වින්දිතයන් 5,430 දෙනෙකුට රු.786,977,664 ක මුදලක් ගෙවා තිබුණ ද, අදාළ මුදල ආදායකයාට ලැබුණු බවට තහවුරු කරගෙන නොතිබුණි. | සෑම ලිපිගොනුවකටම අදාළව ගෙවීම් සිදු කිරීමට පෙර අදාළ නව බැංකු විස්තර හෝ පවතින විස්තරවල නිරවද්‍යතාවය තහවුරු කර එවන ලෙස අදාළ ප්‍රතිලාභියාට ලිපියක් යොමු කරනු ලබයි. මෙමඟින් යාවත්කාලීන තොරතුරු මත පමණක් පදනම්ව ගෙවීම් කිරීම සිදුකළ බව දක්වා ඇත. | මුදල් රෙගුලාසි 264 ප්‍රකාරව කටයුතු කිරීමට පියවරගත යුතු ය. |
| | (ii.) | 371(2)(ආ) ඡේදය | කිසියම් විශේෂිත කාර්යයක් සඳහා මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් එක් අවස්ථාවකදී රු.100,000 ක උපරිමයක් දක්වා තත්කාර්ය අතුරු අග්‍රිමයක් ලබාදීමට ගණන්දීමේ නිලධාරියෙකුට හැකි ය. කාර්යයන් ඉටු කිරීමේදී මීට අනුගත නොවී රු.100,000 කට වඩා වැඩි මුදලක් අවශ්‍ය වන අවස්ථාවේදී ඒ සඳහා නිසි අනුමැතිය ලබා නොගෙන මාණ්ඩලික නිලධාරීන් කිහිපදෙනෙකු එකතු වී රු.100,000 හෝ ඊට අඩු මුදලක් වශයෙන් තත්කාර්ය අතුරු අග්‍රිමය | මෙකී තත්කාර්ය අතුරු අග්‍රිම ලබාගත් ව්‍යාපෘතීන් සඳහා සාමාජික මණ්ඩලයේ පූර්ණ අනුමැතිය ලබා ගෙන ඇත. | මුදල් රෙගුලාසි 371(2)(ආ) ප්‍රකාරව කටයුතු කිරීමට පියවර ගත යුතු ය. |

| | | | | |
|---|---|---|---|---|
| | | කොටස්කර ලබාගෙන මුළු තත්කාර්ය අතුරු අග්‍රිම මුදල් ප්‍රමාණය අදාළ කාර්යය සඳහා අධ්‍යක්ෂවරිය විසින් වියදම්කර තිබුණි. | | |
| **(ආ)** | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන චක්‍රලේඛයේ රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ මාර්ගෝපදේශ සංග්‍රහය | | | |
| (i.) | 2.3 ඡේදය | ➢ මාර්ගෝපදේශ සංග්‍රහ අනුව 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සකස්කර නොතිබුණි. | පොදු ව්‍යවසාය චක්‍රලේඛ අංක 01/2021 පදනම් කොට ගෙන ඉදිරියේදී වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට අදහස් කරන බව දක්වා ඇත. | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| | | ➢ 2023 වර්ෂය සඳහා උපායමාර්ගික සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම චක්‍රලේඛ ප්‍රතිපාදන ප්‍රකාරව සකස්කර ඉදිරිපත් කර නොතිබුණි. | පොදු ව්‍යවසාය චක්‍රලේඛ අංක 01/2021 දරන චක්‍රලේඛය පදනම් කරගනිමින් ඉදිරියේදී උපාය මාර්ගික සැලැස්මක් සකස් කිරීමට බලාපොරොත්තු වන බව දන්වා ඇත. | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ii.) | 3.1 ඡේදය | එහි ඇමුණුම 03 හි සඳහන් පරිදි මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ යුතු වාර්ෂික වාර්තාවේ අවම වශයෙන් හෙළිදරව් කළ යුතු අංග වන ආයතනයේ දැක්ම හා මෙහෙවර, සභාපති අදහස් දැක්වීම, අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව, විගණන කළමනාකරණ වාර්තාව හා පසුගිය ආසන්නතම අවුරුදු 10 ක ආයතනයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ තොරතුරු ඇතුළත්කර නොතිබුණි. | වාර්ෂික වාර්තාවට ජාතික විගණන කාර්යාලය විසින් පෙන්වාදී ඇති තොරතුරු ඉදිරියේදී ඇතුළත්කර සකස් කිරීමට සටහන් කරගත් බව දක්වා ඇත. | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1. මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.13,642,455 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිවිරුද්ධ ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.19,268,441 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.32,910,896 ක

පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ප්‍රත්‍යාගණනය කරන ලද රථවාහනවල ක්ෂය වැඩිවීම හා පෙර වර්ෂයේ ප්‍රත්‍යාගණන අතිරික්තයක් පැවතීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1. කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වන්දි ගෙවීමට ඇති ලිපිගොනු සංඛ්‍යාව නිවැරදිව තහවුරු කරගැනීම සඳහා වන්දි ඉල්ලුම් කිරීමේ ලිපිගොනු විස්තර ඇතුළත් ලේඛනයක් විගණනයට ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිය ද, එවැනි ලේඛනයක් ඉදිරිපත් කිරීමට අපොහොසත් විය. 2023 දෙසැම්බර් 31 දිනට තවදුරටත් වන්දි ගෙවීමට ඇති ලිපිගොනු 8,626 ක් පවතින බව තිබුණ ද, කාලවිශ්ලේෂණයක් ඉදිරිපත් නොවූ අතර, මින් ලිපිගොනු 4,917 කට අදාළ ව රු.1,802,446,195 ක මුදලක් වන්දි ලෙස ගෙවීමට නියමිතව තිබුණ ද, ඉතිරි ලිපිගොනු 3,709 ක ප්‍රමාණයට අදාළව වන්දි ගෙවීමට ඇති මුදල තක්සේරුකර නොතිබුණි. | නිරීක්ෂණය පිළිගෙන ඇති අතර සෘජුවම පරිඝණක පද්ධතිය තුළින් අවශ්‍යතාවයට අනුකූලව නාම ලේඛනයක් ලබාගැනීමට හැකි වන ලෙස දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීමට පියවර ගනිමින් පවතින බවත් කාලවිශ්ලේෂණ ආකෘතියට අදාළ තොරතුරු ලබාදීමට කටයුතු කරන බවත් දන්වා ඇත. නොගෙවා ඇති ලිපිගොනු අතරින්, අවශ්‍ය ලේඛන සම්පූර්ණකර නොතිබීම, වන්දි සඳහා හිමිකම් නොමැතිවීම, ලිපිගොනු වසා තැබීම යනාදී හේතුන් මත වන්දි මුදල් තක්සේරුවක් ඉදිරිපත් කළ නොහැකි බව දක්වා ඇත. | වන්දි ගෙවීමට ඇති ලිපිගොනු ක්‍රමවත්ව පවත්වාගෙන යා යුතු වන අතර, වන්දි ඉල්ලා ලැබෙන ලිපිගොනු ක්‍රමවත්ව ලේඛනයක ඇතුළත් කළ යුතු ය. එමෙන්ම අයවැය ඇස්තමේන්තු නිවැරදිව සකස්කර නියමිත වේලාවට ප්‍රතිපාදන ලබාගෙන වන්දි ගෙවීම් සිදුකළ යුතු බැවින් ගෙවීමට ඇති වන්දි මුදල් තක්සේරු කිරීමට පියවරගත යුතු ය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ වන්දි ලෙස ගෙවන ලද රුපියල් මිලියන 1,335 ක මුදලින් රුපියල් මිලියන 753 ක් 2023 වර්ෂයේ අයදුම් කළ, අරගලයෙන් විපතට පත් වන්දිලාභීන්ට ගෙවීම්කර තිබුණ ද, පෙර වර්ෂවල සිට අනෙකුත් වන්දි සඳහා අයදුම් කළ වන්දිලාභීන්හට රුපියල් මිලියන 582 ක් පමණක් ගෙවා තිබුණි. ඒ අනුව 2023 වර්ෂයට පෙර අයදුම්කළ වන්දිලාභීන්හට වන්දි ගෙවීමේදී ප්‍රමුඛතාවක් ලබාදීම සාපේක්ෂ වශයෙන් අවම මට්ටමක විය. | නිරීක්ෂණයට එකඟ වන අතර, 2022 මැයි 09 දින සිදු වූ දේශපාලන නොසන්සුන්තාවයන් හේතුවෙන් අවශ්‍යතා ප්‍රමුඛතාවය මත පීඩාවට පත්වූවන්ගේ නිවාසවලට සිදු වූ හානි සඳහා හානිපූරණයන් සැලසීමට අධ්‍යක්ෂ මණ්ඩලය හා අමාත්‍ය මණ්ඩලයත් අනුමතකර ඇති බව දන්වයි. | පෙරවර්ෂවල සිට අයදුම් කළ වන්දිලාභීන්හට වන්දි ගෙවීමේදී ප්‍රමුඛතාවක් ලබාදීමට කටයුතු කළ යුතු ය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළදී වන්දි ගෙවීම් සඳහා චෙක්පත් නිකුත් කළ ද, යාවත්කාලීන නොකරන ලද තොරතුරු මත වන්දි ලබාදීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 | නිරීක්ෂණයට එකඟ වන අතර, ස්ලිප් ක්‍රමය (Slip System) යටතේ සිදුවන අගරු වීම් වළක්වාලීම සඳහා ගෙවීම් සිදු කිරීමට පෙර අදාළ නව බැංකු විස්තර හෝ | අදාළ ප්‍රතිලාභීන්ගේ යාවත්කාලීන කරන ලද තොරතුරු මත පදනම්ව වන්දි ගෙවීම් නිර්දේශ කිරීම කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | දින වන විට වන්දිලාභීන් හට ලබාදී තිබුණු චෙක්පත් අතුරින් රු.39,124,653 ක් වටිනා චෙක්පත් 318 ක් බැංකුව විසින් අගරුකර තිබුණි. මෙම වන්දි මුදල්වලින් රු.29,818,995 ක ප්‍රමාණයක් නැවත එම වන්දිලාභීන් වෙතම සෘජු ප්‍රේෂණ මගින් ලබාදී තිබුණු අතර, තවත් රු.9,305,658 ක ප්‍රමාණයක් නව වන්දිලාභීන් 85 දෙනෙකු වෙත ලබාදී තිබුණි. | පවතින විස්තරවල නිරවද්‍යතාවය තහවුරු කර එවන ලෙස අදාළ ප්‍රතිලාභියාට ලිපියක් යොමු කරනු ලබයි. මෙමඟින් යාවත්කාලීන තොරතුරු මත පමණක් පදනම්ව ගෙවීම් කිරීම සිදුවන බව දක්වා ඇත. | |
| (ඈ) | 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන තුළ නිරූපනය කර තිබූ 2022 සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා විදුලිබලය හා ජලය වෙනුවෙන් අතුරුදහන් වූ කාර්යාලයෙන් අයවිය යුතු රු.737,485 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුළදී ද අයකරගැනීමට කටයුතුකර නොතිබුණි. | අඛණ්ඩව අතුරුදහන් වූවන්ගේ කාර්යාල වෙත අදාළ ඉල්ලීම් යොමුකර මෙම මුදල හැකි ඉක්මනින් ප්‍රතිපූරණය කරගැනීමට කටයුතු කරන බව දක්වා ඇත. | අයවිය යුතු මුදල් විධිමත් පරිදි අයකරගැනීමට කඩිනමින් කටයුතු කළ යුතු ය. |
| (ඉ) | 2019 වර්ෂයේදී පාස්කු ප්‍රහාරය සඳහා වන්දි ප්‍රදානය කිරීමේදී වන්දිලාභියෙකුට වැඩිපුර ගෙවන ලද රු.300,000 ක් හා රු.112,900 ක් වටිනා ලිපිද්‍රව්‍ය තොගයක් අස්ථානගත වීමේ සම්පූර්ණ අලාභය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකරගැනීමට ප්‍රමාණවත් පියවර නොගෙන අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය පරිදි පොත්වලින් කපා හැරීමට තීරණය කර තිබුණි. | මෙහි සම්පූර්ණ අලාභය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකරගැනීම සඳහා මූලික විමර්ශණ මණ්ඩල පත්කර එම නිර්දේශයන් මත මෙම පාඩුව නිශ්චිත වශයෙන් නිලධාරීන්ගේ වරදකින් සිදු නොවූවක් බවට තහවුරු කරගැනීමෙන් පසු සාමාජික මණ්ඩල අනුමැතිය මත ගිණුම් පොත්වලින් කපා හැරීමට කටයුතු කර ඇත. | මෙම අලාභ අයකිරීම් සම්බන්ධව ප්‍රමාණවත් පියවර ආයතනය විසින් ගත යුතු ය. |
| (ඊ) | 2023 සැප්තැම්බර් 01 වන දින සිට වසර දෙකක කාලයක් සඳහා හානිපූරණය සඳහා වන කාර්යාලයේ "අධ්‍යක්ෂ" තනතුර සඳහා ද්විතීයන පදනම යටතේ විධිමත් බඳවාගැනීමේ පටිපාටියකින් බැහැරව නිලධාරිනියක් බඳවාගෙන තිබුණි. එසේ වුව ද, බාහිර හෝ අභ්‍යන්තර අයදුම්කරුවෙකු අධ්‍යක්ෂ තනතුර සඳහා බඳවා ගත්තේ නම්, මසකට වැටුප් හා සියලු දීමනා වශයෙන් රු.163,055 ක් ගෙවිය යුතු වුව ද, | බඳවාගැනීම් පටිපාටියට අනුව අධ්‍යක්ෂ තනතුර සඳහා මූලික වැටුප රු.74,005 ක් වන අතර දළ වැටුප රු.104,085 ක් ලෙස රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතියට අනුව හා 13 පරිශිෂ්ඨය අනුව ද්විතීයන පදනම මත බඳවාගන්නා නිලධාරිනියගේ මාසික ඒකාබද්ධ වැටුපෙන් සියයට 25 ක දීමනාවක් හා වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප සඳහා සියයට 25 ක මුදලක් ආයතනය විසින් ගෙවනු ලබයි. තව ද අධ්‍යක්ෂකවරිය විසින් ආයතනයේ | විධිමත් බඳවාගැනීමේ පටිපාටියකට අනුව නිලධාරින් බඳවාගත යුතු ය. |

| | | |
|---|---|---|
| ද්විතීයන පදනම යටතේ බඳවාගත් නිලධාරිනියට මසකට වැටුප් හා සියලු දීමනා වශයෙන් රු.201,474 ක් ගෙවීම නිසා රු.38,419 ක අතිරේක වියදමක් දැරීමට සිදු වී තිබුණි. අධ්‍යක්ෂ තනතුරට බඳවාගත් මෙම නිලධාරිනිය සඳහා රාජකාරී ඉටු කිරීමට රාජකාරී ලැයිස්තුවක් ලබාදී නොතිබූ අතර, කාර්යයන් ඉටු කිරීම සම්බන්ධව ප්‍රමාණවත් කාර්යසාධනයක් ද සිදු වී නොතිබුණි. | බලය පැවරීමට අනුව සියලු පාලන/ වන්දි ගෙවීම් නිර්දේශ හා අනුමැතිය ලබාදීම් කරනු ලබන අතර, ව්‍යවස්ථාපිත බලතල ක්‍රියාත්මක කරනු ලබයි. | |

## 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කාර්යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට අනුමත නිලධාරීන් සංඛ්‍යාව 77 ක් වූ අතර, තථ්‍ය නිලධාරීන් සංඛ්‍යාව 50 ක් වූයෙන් තනතුරු 06 කට පුරප්පාඩු 27 ක් පැවතුණි. | පුරප්පාඩු වූ තනතුරු සඳහා බඳවාගැනීමේ අවශ්‍යතාවය දිගින් දිගටම අමාත්‍යාංශ ලේකම් මඟින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ අතර, 2023 දෙසැම්බර් 12 හා 20 දිනැතිව තනතුරු 05 ක් සඳහා බඳවා ගැනීමට අනුමැතිය ලබාදී ඇති අතර, සම්මුඛ පරීක්ෂණ සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | ඵලදායී සේවා මට්ටමක් පවත්වා ගැනීම සඳහා සේවක මණ්ඩල සමාලෝචනයක් සිදුකර ඒ අනුව අවශ්‍ය කටයුතු සිදු කිරීමට කළමනාකරණය පියවර ගත යුතු ය. |